අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/1/1/3/2-I

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2022.05. 09

චක්‍රලේඛ අංකය - 23 / 2022

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ.අ.වරුන්,

සියලුම පරිවෙණාධිපති හිමිවරුන්,

සියලුම රජයේ පාසල්වල විදුහල්පතිවරුන්,

රජය අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත,

**සමස්ත ලංකා පාසල් භරත නාට්‍යම් තරගය සහ කථක් නර්තන තරගය - 2022**

අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව මගින් පූර්වෝක්ත තරගය 2022 වර්ෂයේ සිට පළමු වරට පැවැත්වීමට විධිවිධාන යොදා ඇත. ඒ හා සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛය අනුව ඔබ පළාතේ/ කලාපයේ / කොට්ඨාසයේ / විදුහලේ, අදාල ගුරුභවතුන් සහ ශිෂ්‍ය / ශිෂ්‍යාවන් දැනුවත් කර මෙම තරගයට ඔවුන්ගේ නිර්මාණ ඉදිරිපත් කිරීමට අදාල කටයුතු සිදු කරන ලෙස දන්වමි.

<u>තරගයේ අරමුණු</u>

නර්තන විෂයය සහ ඒ හා බැඳුණු රසාස්වාදය වර්ධනය කිරීමත්, ගුරුවරුන් ශිෂ්‍යයින් ඇතුළුව පාසල් ප්‍රජාවගේ නිර්මාණ කුසලතාවය වර්ධනය කිරීමත්, නර්තන කලාවේ විවිධ පර්යේෂණ හා නිර්මාණ සිදුකිරීමත්, තුළින් සිසු / සිසුවියන්ගේ පෞරුෂ වර්ධනය මෙන්ම නර්තන අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය සිදු කිරීමත් මෙම තරගයේ අරමුණු වේ.

- මෙම තරග චක්‍රලේඛය පහත ආකාරයට භාරතීය නර්තන සම්ප්‍රදායන් දෙකක් යටතේ සැකසී ඇත.

  A. භරත නාට්‍යම්

  B. කථක් නර්තනය

- ඉහත නර්තන සම්ප්‍රදායයන් යටතෙහි තරග සඳහා වෙන වෙනම ඉදිරිපත් වීමට අවස්ථාව ලැබේ. එම නර්තන සම්ප්‍රදායන් දෙක යටතෙහි තරග ශීර්ෂ වෙන වෙනම පෙළ ගස්වා ඇති අතර, ඒ යටතේ අදාළ නීති රීති සහ කොන්දේසි ද පෙළගස්වා ඇත.

- **<u>A - භරත නාට්‍යම් තරගය සඳහා පොදු නීති රීති</u>**

**01.** සහභාගීවන් තරගකරුවන් ප්‍රධාන අංශ 03 කට බෙදේ.

1. ජ්‍යෙෂ්ඨ 1 කොටස - 10 සහ 11 ශ්‍රේණි
2. ජ්‍යෙෂ්ඨ 2 කොටස - 12 සහ 13 ශ්‍රේණි
3. විවෘත කොටස - 10 සිට 13 ශ්‍රේණි දක්වා

**02.** ඉහත අංශ ජ්‍යෙෂ්ඨ 1 සහ 2 අංශ, ආකාරයට වර්ග කරනු ලැබේ.

1. ඒකල නර්තනය - පිරිමි - ශාස්ත්‍රීය
2. ඒකල නර්තනය - පිරිමි - ගැමි
3. සමූහ නර්තනය - පිරිමි - ශාස්ත්‍රීය
4. සමූහ නර්තනය - පිරිමි - ගැමි
5. ඒකල නර්තනය - ගැහැණු - ශාස්ත්‍රීය
6. ඒකල නර්තනය - ගැහැණු - ගැමි
7. සමූහ නර්තනය - ගැහැණු - ශාස්ත්‍රීය
8. සමූහ නර්තනය - ගැහැණු - ගැමි
9. මිශ්‍ර නර්තනය - ශාස්ත්‍රීය
10. මිශ්‍ර නර්තනය - ගැමි

**03.** ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පහත සඳහන් ආකාරයට පාසල් වර්ග කරනු ලැබේ.

1. ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල්
2. ශිෂ්‍ය සංඛ්‍යාව 301-1000 අතර පාසල්
3. ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල්

- ඉහත සියලුම පාසල් කාණ්ඩවලට අයත් තරග ශීර්ෂ පහතින් දැක්වේ. එම තරග අංග සඳහා, පාසල් වර්ග යටතේ වෙන් වෙන් වශයෙන් තරගයට ඉදිරිපත් විය හැකිය.

| අංක | අංශය | පිරිමි/ ගැහැණු | ඒකල/සමූහ | ශාස්ත්‍රීය/ ගැමි | කාලය |
|---|---|---|---|---|---|
| 01 | 1. ජ්‍යෙෂ්ඨ ( 1 ) | පිරිමි | ඒකල | තිශ්‍ර අලාරිප්පු ( ශාස්ත්‍රීය) | 3-4 විනාඩි |
| 02 | | පිරිමි | ඒකල | පුන්කලස් ( ගැමි ) | 4-6 විනාඩි |
| 03 | | පිරිමි | සමූහ | භාරති ගී - "දිශා අටම විසිරී" (ශාස්ත්‍රීය) | 5-7 විනාඩි |
| 04 | | පිරිමි | සමූහ | කාවඩි නැටුම (ගැමි) | 5-7 විනාඩි |
| 05 | | ගැහැණු | ඒකල | ශෛලදීශ්වරම් ආරබි / සාවේරි (ශාස්ත්‍රීය) | 4-5 විනාඩි |
| 06 | | ගැහැණු | ඒකල | පූජා නැටුම (ගැමි) | 5-6 විනාඩි |
| 07 | | ගැහැණු | සමූහ | ශබ්දය (ශාස්ත්‍රීය) | 3-5 විනාඩි |
| 08 | | ගැහැණු | සමූහ | කළගෙඩි නැටුම (ගැමි) | 5-6 විනාඩි |
| 09 | | මිශ්‍ර | සමූහ | භාරතිදාසන් ගීත "සංඛ නාදය" - (ශාස්ත්‍රීය) | 5-7 විනාඩි |
| 10 | | මිශ්‍ර | සමූහ | ගොවි නැටුම (ගැමි) | 5-7 විනාඩි |
| 11 | 2.ජ්‍යෙෂ්ඨ ( 2 ) | පිරිමි | ඒකල | තිල්ලානා (කැමති ගීතයක්) (ශාස්ත්‍රීය) | 5-6 විනාඩි |
| 12 | | පිරිමි | ඒකල | නව නැටුම (ගැමි) | 4-6 විනාඩි |
| 13 | | පිරිමි | සමූහ | කවිත්වය (කැමති ගීතයක්) (ශාස්ත්‍රීය) | 4-6 විනාඩි |
| 14 | | පිරිමි | සමූහ | සටන් පාරම්පරික නැටුම (ගැමි) | 4-6 විනාඩි. |
| 15 | | ගැහැණු | ඒකල | පදම් (කැමති ගීතයක්) (ශාස්ත්‍රීය) | 5-7 විනාඩි |
| 16 | | ගැහැණු | ඒකල | නව නැටුම (ගැමි) | 5-7 විනාඩි |
| 17 | | ගැහැණු | සමූහ | වර්ණම් (කැමති රාග ගීතයක්) (ශාස්ත්‍රීය) | 5-6 විනාඩි |
| 18 | | ගැහැණු | සමූහ | නව නැටුම - ස්ත්‍රී නිදහස ( ගැමි) | 8-10 විනාඩි |
| 19 | | මිශ්‍ර | සමූහ | වර්ණම් (කැමති රාග ගීතයක්) (ශාස්ත්‍රීය) | 8-10 විනාඩි |
| 20 | | මිශ්‍ර | සමූහ | ඔයිලාට්ටම්( ගැමි) | 6-8 විනාඩි |
| 21 | 3. විවෘත | | සමූහ | නාට්‍ය නැටුම් - සාහිත්‍ය පාත්‍ර චරිතය සමාජ ප්‍රතිසංස්කරණ සිතිවිල්ලෙන් නැවත ඇති කිරීම. | 15-20 විනාඩි |

- සහාය සංගීතය සඳහා උපරිම වශයෙන් ගායකයින් දෙදෙනෙක්, වාදකයින් දෙදෙනෙක් (තාල වාදනය සඳහා 1, ස්වර වාදනය සඳහා 1) සහ නර්තන ගුරුභවතා සමග 5 දෙනෙකුට සහභාගිවිය හැක.
( නර්තන නාට්‍යය සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩ පිළිබඳ සීමාවක් නොමැත.)
- සමූහ නර්තන තරග සඳහා සිසු / සිසුවියන්, ඉදිරිපත් වීමේ දී අවම සංඛ්‍යාව 4 දෙනෙකු ලෙස සහ උපරිම සංඛ්‍යාව 8 දෙනෙකු ලෙස විය යුතු ය.
- මිශ්‍ර තරග අංග සඳහා සිසුන් තෝරා ගැනීමේ දී, ගැහැණු හෝ පිරිමි යන එක් වර්ගයකින් අවම වශයෙන් දෙදෙනෙකු වත් වන පරිදි සහභාගී විය යුතු ය. (පොදුවේ සියලුම පාසල්)
- විවෘත කොටසෙහි නෘත්‍ය නාට්‍ය යටතේ රංගනය සඳහා උපරිම සංඛ්‍යාව 12 දෙනෙකු වන ලෙය සහභාගි විය හැකිය.

- **<u>B - කථක් නර්තන තරගය සඳහා පොදු නීති රීති</u>**

**උතුරු ඉන්දීය ශාස්ත්‍රීය කථක් නර්තනය යටතේ පවත්වන තරග මෙවර ප්‍රධාන වශයෙන් කාණ්ඩ 02 ක් යටතේ පවත්වනු ලැබේ.**

1. පළමු කාණ්ඩය 10 – 11 වසර සිසු /සිසුවියන් සඳහා
2. දෙවන කාණ්ඩය 12 – 13 වසර සිසු /සිසුවියන් සඳහා

**පාසල්වල ශිෂ්‍ය ධාරිතාවය සැලකිල්ලට ගනිමින් නැවත එම කාණ්ඩ කොටස් 03 කට බෙදා ඇත.**

1. සිසුන් 300 ට අඩු පාසල්
2. සිසුන් 301 -1000 අතර පවතින පාසල්
3. සිසුන් 1001 ට වඩා වැඩි පාසල් ලෙය වේ.

**මෙම වර්ගීකරණයට ලක් වූ සියලු පාසල් සඳහා**

1. ඒකල 2. යුගල 3. සමූහ
ලෙය තෙවදැරුම්වූ ශීර්ෂ මත තරග පවත්වනු ඇත.

* වස්ත්‍රාභරණ -පාරම්පරික කථක් නෘත්‍යයට අනුව නිර්මාණය විය යුතු ය. නර්තනයේ යෙදෙන අංගයට අදාල සංස්කෘතියට ( හින්දු ,මුස්ලිම් සම්ප්‍රදායන් ) අනුව සකස් විය යුතු වේ.
* ගීතය - හින්දි හෝ ව්‍රජ් හෝ උර්දු යන භාෂාවකින් රචනාවූ ගීතයක් විය යුතු ය. ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක් විසින් ගීතය ගායනා කළ යුතු වේ.
* වාදන භාණ්ඩ - තබ්ලා, පඛාවාජ්, හාර්මෝනියම්, වයලින්, සිතාර්, සාරංගි, දිල්රුබා, එස්රාජ්, සරෝද්, ගිටාර් හා බටනලාව යොදා ගත හැකිය.
* වාදනය සඳහා සහභාගී විය හැකි සංඛ්‍යාව, උපරිමය 05 කි.
* පඪන්ත් පද උච්චාරණය ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක් විසින් සිදු කළ යුතු වේ.
* චක්‍ර භාවිතාව, අංග චලන හා පාද හැසිරවීමේ කුසලතාව, භාව - අභිනය, ගායනය, වාදනය හා නෘත්‍යයේ සහ සම්බන්ධතාව සහිත රසබර ඉදිරිපත් කිරීම විශේෂ ඇගයීමට ලක් වේ.
* පසුතල නිර්මාණ ඇගයීමට ලක් නොවේ.

1.1.1 ඒකල (සාම්ප්‍රදායික) ශාස්ත්‍රීය කථක් නර්තනය
1.1.2 යුගල (සාම්ප්‍රදායික) ශාස්ත්‍රීය කථක් නර්තනය

(ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා)

1.2.1 ඒකල (සාම්ප්‍රදායික) ශාස්ත්‍රීය කථක් නර්තනය
1.2.2 යුගල (සාම්ප්‍රදායික) ශාස්ත්‍රීය කථක් නර්තනය

(ශිෂ්‍ය සංඛ්‍යාව 301 - 1000 අතර පවතින පාසල් සඳහා)

1.3.1 ඒකල (සාම්ප්‍රදායික) ශාස්ත්‍රීය කථක් නර්තනය
1.3.2 යුගල (සාම්ප්‍රදායික) ශාස්ත්‍රීය කථක් නර්තනය

(ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් සඳහා)

1.1.3 ඒකල (භජන්) ශාස්ත්‍රීය කථක් නර්තනය
1.1.4 යුගල (භජන්) ශාස්ත්‍රීය කථක් නර්තනය

(ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා)

1.2.3 ඒකල (භජන්) ශාස්ත්‍රීය කථක් නර්තනය
1.2.4 යුගල (භජන්) ශාස්ත්‍රීය කථක් නර්තනය

(ශිෂ්‍ය සංඛ්‍යාව 301 - 1000 අතර පවතින පාසල් සඳහා)

1.3.3 ඒකල (භජන්) ශාස්ත්‍රීය කථක් නර්තනය
1.3.4 යුගල (භජන්) ශාස්ත්‍රීය කථක් නර්තනය

(ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් සඳහා)

**1.1.3, 1.1.4, 1.2.3, 1.2.4, 1.3.3 හා 1.3.4 යන ශීර්ෂවලට අදාල පොදු කොන්දේසි**

* සහභාගීවිය හැකි සංඛ්‍යාව - තරගකරු / තරගකරුවන් හැර සහාය වාදකයින් ගණන අවමය 05 කි. උපරිමය 07 කි.

* කාලය ගීතයේ නියමිත ස්වභාවික කාලය වේ.

* ගීතය තුල ආමද්, තිහායි, ටුකඩා, මුඛඩා, පරන් හා ලඩි වැනි ශාස්ත්‍රීය අංගත් වක්‍ර නිර්මාණාත්මකව භාවිතාව ඇගයීමට ලක් වේ.

2.1.1. ඒකල (සාම්ප්‍රදායික) ශාස්ත්‍රීය කථක් නර්තනය
2.1.2. යුගල (සාම්ප්‍රදායික) ශාස්ත්‍රීය කථක් නර්තනය

(ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා)

2.2.1. ඒකල (සාම්ප්‍රදායික) ශාස්ත්‍රීය කථක් නර්තනය
2.2.2. යුගල (සාම්ප්‍රදායික) ශාස්ත්‍රීය කථක් නර්තනය

(ශිෂ්‍ය සංඛ්‍යාව 301 - 1000 අතර පවතින පාසල් සඳහා)

2.3.1. ඒකල (සාම්ප්‍රදායික) ශාස්ත්‍රීය කථක් නර්තනය
2.3.2 යුගල (සාම්ප්‍රදායික) ශාස්ත්‍රීය කථක් නර්තනය

(ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් සඳහා)

**2.1.1, 2.1.2, 2.2.1, 2.2.2, 2.3.1 හා 2.3.2 යන ශිර්ෂවලට අදාල පොදු කොන්දේසි**

* සහභාගිවිය හැකි සංඛ්‍යාව - තරගකරු / තරගකරුවන් හැර සහාය වාදකයින් ගණන අවමය 05 කි. උපරිමය 07 කි.

* කාලය අවමය විනාඩි 10 උපරිමය විනාඩි 12 කි.

* නිර්මාණය තුල තිබිය යුතු ශාස්ත්‍රීය අංග - පිවිසීම, උපජ්, ඨායි, උඨාන්, ආමද්, පරන්ජුඩි ආමද්, සලාමි, සාදා ටුකඩා ( නට්වරී,පර්මේලු), නිකාස් / භාව ගත්, සාදාපරන් ( විවිධ), ලඩි, තිහායි ( විවිධ) හා මුඛඩා.
* වක්‍ර භාවිතාව, අංග වලන හා පාද හැසිරවීමේ කුසලතාව, භාව අභිනය හා ඉදිරිපත් කිරීම විශේෂ අවධානයට ලක් කෙරේ.

* නර්තනයේ යෙදෙන එක් ශාස්ත්‍රීය අංගයක් හෝ තරගකරු විසින් පඨන්ත් කිරීම අනිවාර්ය වේ.

2.1.3. ඒකල (ඝූමරී,දාදරා) ශාස්ත්‍රීය කථක් නර්තනය
2.1.4. යුගල (ඝූමරී,දාදරා) ශාස්ත්‍රීය කථක් නර්තනය
(ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා)

2.2.3 ඒකල (ඝූමරී,දාදරා) ශාස්ත්‍රීය කථක් නර්තනය
2.2.4 යුගල (ඝූමරී,දාදරා) ශාස්ත්‍රීය කථක් නර්තනය
(ශිෂ්‍ය සංඛ්‍යාව 301 - 1000 අතර පවතින පාසල් සඳහා)

2.3.3 ඒකල (ඝූමරී,දාදරා) ශාස්ත්‍රීය කථක් නර්තනය
2.3.4 යුගල (ඝූමරී,දාදරා) ශාස්ත්‍රීය කථක් නර්තනය
(ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් සඳහා)

**2.1.3, 2.1.4, 2.2.3, 2.2.4, 2.3.3. හා 2.3.4 යන ශීර්ෂ සඳහා නියමිත කොන්දේසි.**

* සහභාගීවිය හැකි සංඛ්‍යාව - තරගකරු / තරගකරුවන් හැර සහාය වාදකයින් ගණන අවමය 05 ක් හා උපරිමය 07 කි.

* කාලය ගීතයේ නියමිත ස්වභාවික කාලය වේ.

* ගීතය තුල ආමද්, තිහායි, ටුකඩා, මුඛඩා, පරන්හා ලඩි වැනි ශාස්ත්‍රීය අංගත් වක්‍ර නිර්මාණාත්මකව භාවිතාව ඇගයීමට ලක් වේ.

**විවෘත කාණ්ඩය ( සමූහ) - සියලුම පාසල්වල සිසුන් සඳහා පොදුවේ සහභාගීවිය හැකිවේ.**

3.1 සමූහ ( ගසල් / හෝලි) ශාස්ත්‍රීය කථක් නර්තනය
3.2 සමූහ ( තරානා) ශාස්ත්‍රීය කථක් නර්තනය

**3.1 හා 3.2 යන ශීර්ෂ සඳහා නියමිත තරග කොන්දේසි**

* සහභාගීවිය හැකි සංඛ්‍යාව - තරගකරු / තරගකරුවන් අවමය 05 ක් හා උපරිමය 10 වන අතර සහාය වාදකයින් ගණන අවමය 05 ක් හා උපරිමය 08 කි.

* කාලය ගීතයට නියමිත කාලය ලෙස සැලකේ.

* ගීතය තුල ආමද්, තිහායි,ටුකඩා, මුඛඩා, පරන් හා ලඩි වැනි ශාස්ත්‍රීය අංගත් වක්‍ර නිර්මාණාත්මකව භාවිතාව ඇගයීමට ලක් වේ.

## භරත නාට්‍යම් සහ කථක් නර්තන තරග දෙකටම පොදු උපදෙස්

### 1 සහභාගීත්වය

1.1 රජයේ පාසල්වල සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල සිසු / සිසුවියන්ට මෙම තරගයට සහභාගි විය හැකිය.

1.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් / පළාත් අධ්‍යාපන ලේකම් / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය සහිතව, තරගයට ඉදිරිපත්වන ඕනෑම පාසලකට,එම පාසල පිහිටා තිබෙන පළාතේ වෙනත් පාසලක ගුරුවරුන් හෝ සිසුන් සහාය වාදනය සඳහා සහභාගි කරගත හැකිය. සෞන්දර්ය ගුරුවරයෙකු නොමැති පාසල් සඳහා ද ඉහත කී පටිපාටිය අනුගමනය කළ හැකි වේ.

1.3 සහාය වාදනයට ගුරුවරුන් සහභාගී වන්නේ නම්, එය උපරිමය දෙදෙනෙකුට සීමා විය යුතු ය.

1.4 පෞද්ගලික පාසලකට රජයේ පාසලක ගුරුවරයෙක් හෝ ශිෂ්‍යයෙකු සහාය වාදනය සඳහා සහභාගි කරවා ගතහැකි නමුත්, රජයේ පාසලකට පෞද්ගලික පාසල් ගුරුවරයෙකු හෝ ශිෂ්‍යයෙකු සහභාගි කරගත නොහැක. එමෙන්ම රජය විසින් පත්කරන ලද ගුරු සහායකවරුන්ද සහාය වාදනය සඳහා සහභාගි කරගත හැකිය.

1.5 මෙම තරගය සඳහා 10 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසු / සිසුවියන්ට සහභාගි විය හැකි අතර, එම පාසල මගින් දෙවන වර උසස් පෙළ විභාගයට පෙනීසිටින සිසු / සිසුවියන්ටද සහභාගි විය හැකිය.

1.6 එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ තරග ශීර්ෂ 03 ක් සඳහා පමණකි. (ඉහත සඳහන් ආකාරයට ශිෂ්‍ය සංඛ්‍යාව ලෙස වර්ග කරන ලද පාසල් සඳහාවූ තරග වෙන් වෙන් වශයෙන් පවත්වනු ලැබේ.)

1.7 මෙම තරගය සඳහා නිර්මාණය කරන ගී පදමාලා ආදිය ජාති ආගම, කුලභේදවලට හෝ පටු දේශපාලනික අදහස් උදහස්වලට හෝ තුඩු නොදෙන, එවැනි ගම්‍ය නොවන එම ගී පදමාලා තරගයට ඉදිරිපත්වීමට ප්‍රධාන විනිශ්චය මණ්ඩලය වෙත ලබාදීම සඳහා තරග මණ්ඩලයේ ප්‍රධාන සංවිධායක වෙත ලබා දිය යුතු ය.

1.8 කලාප සහ පළාත් තරග අවස්ථාවන්හි දී, නර්තන තරග සඳහා ප්‍රායෝගික පුහුණු ඇඳුමින් සැරසී ඉදිරිපත් විය යුතු ය. (නෘත්‍ය නාට්‍ය තරගවලට පමණක් මෙය බල නොපානු ඇත.) ජාතික තරගයට සහභාගී වීමේදී (නර්තනය සඳහා) උචිත ප්‍රාසංගික ඇඳුම් පැළඳුම් සහිතව ඉදිරිපත් විය යුතු ය.

1.9 අවසාන තරග කාල සටහනෙහි, අදාළ තරග ශීර්ෂයන් සඳහා වෙන් කර ඇති කාල සීමාවන් තුළදී සහභාගී නොවන පාසල්, එම අදාල තරග ශීර්ෂ සඳහා ඉදිරිපත් නොවන්නා සේ සලකා ප්‍රතිඵල ලබා දීම සිදුවේ.

### 02. තරග අවස්ථා

2.1 මෙම තරගය කලාප,පළාත් සහ ජාතික වශයෙන් පවත්වනු ලැබේ.

2.2 කලාප තරග අදාල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් සෞන්දර්ය/නර්තන විෂයය භාර නිලධාරිගේ සහාය සහිතව සංවිධානය කල යුතු ය.

2.3 කලාප තරගවල සියලු වගකීම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට පැවරෙන අතර, මෙම චක්‍ර ලේඛයෙහි උපදෙස්වලට අනුව ඔහු කලාප තරග ප්‍රතිඵලවල අවසන් තීරක ද වේ.

2.4 කලාප තරග ජුනි මස අවසානයට පෙර පවත්වා ප්‍රතිඵල, පළාත් තරගසංවිධානය සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.

2.5 කලාප මට්ටමෙන් ප්‍රථම ස්ථානය දිනා ගන්නා තරගකරුවන් පමණක් පළාත් මට්ටමේ තරග සඳහා සුදුසුකම් ලබති.

2.6 පළාත් මට්ටමේ තරග අදාළ පළාතේ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවිසින් සංවිධානය කළ යුතුය.අවශ්‍ය වේ නම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය මත එම පළාතේ සෞන්දර්යය විෂය භාර නිලධාරියෙකු, අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ඇත.

2.7 පළාතේ සියලු වගකීම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරෙන අතර, ඔහු විසින් චක්‍රලේඛ උපදෙස්වලට පටහැනි නොවන ආකාරයට තරග ප්‍රතිඵලවල අවසන් තීරකයා වනු ඇත. මෙම තරගය සැප්තැම්බර් මස අවසානයට පෙර පවත්වා ප්‍රතිඵල ලේඛණය ජාතික මට්ටමේ තරගය සංවිධානය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

2.8 පළාත් මට්ටමෙන් ප්‍රථම ස්ථාන ජයග්‍රාහකයින් පමණක් ජාතික මට්ටමේ තරග සඳහා සුදුසුකම් ලබති.

2.9 ජාතික මට්ටමේ තරග නොවැම්බර් මස අවසානයට පෙර පවත්වනු ලැබේ.

2.10 ඒ ඒ තරගවලට සහභාගි වී ජය ලබන්නන් එම තරහ ශීර්ෂයෙන්ම ජාතික මට්ටම දක්වා සහභාගි වීම අනිවාර්ය වේ.

2.11 කලාප මට්ටමට පෙනී සිට ජයග්‍රහණය කළ සිසු සිසුවියන් ම පළාත් මට්ටමට ද, පළාත් මට්ටමට පෙනී සිට ජයග්‍රහණය කළ සිසු සිසුවියන් ම ජාතික මට්ටමට ද පෙනී සිටීම අනිවාර්ය වේ. මේ සම්බන්ධයෙන් නොවැළැක්විය හැකි යම් ගැටලුවක් මතු වුවහොත්, පාසලේ විදුහල්පතිගේ නිර්දේශ මත කලාප තරග මට්ටමේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේත්, පළාත් තරග මට්ටමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේත්, සමස්ත ලංකා තරග මට්ටමේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය) ගේ අනුමැතිය මත පමණක් එම ගැටලුව නිරාකරණය කර ගත යුතු ය.

2.12 ඒකල හෝ සමූහ තරග ශීර්ෂ යටතේ සහභාගිවන තරගකරුවන් අයත් පාසලක්, කලාප හෝ පළාත් මට්ටමෙන් සහභාගි වී ජයග්‍රහණය ලබා ඇති විටෙක යම් තරගකරුවකුට ඊළඟ තරගය පැවැත්වීමට පෙර තමා සහභාගිවූ පාසලෙන් අස්වී වෙනත් පාසලකට යාමේ අවස්ථාව උදාවී ඇත්නම්, කලාප මට්ටමේ තරගයකට සහභාගී වූ පාසල වෙනුවෙන් සහභාගි වීමට අවස්ථාව ලබාදිය යුතු යි. අදාල තරගකරු අලුතින් ඇතුළත් වූ පාසල වෙනුවෙන් සහභාගිවිය යුත්තේ ඊළඟ වර්ෂයේ තරගයේ සිටය.

2.13 කලාප තරගවලට සහභාගි නොවන කිසිදු පාසලක් පළාත් මට්ටමේ තරගවලට සහභාගිවීම අනුමත කරනු නොලැබේ.

2.14 ඒ ඒ පාසල්වල විදුහල්පතිවරයාගේ අනුමැතිය මත පමණක් තරග අවස්ථාවලට සහභාගි විය යුතු ය.සහාය වාදනය සඳහා වෙනත් පාසලකින් ශිෂ්‍යයෙකු හෝ ගුරුවරයෙකු සහභාගි කර ගැනීමේ දී අදාළ විදුහල්පති වරයාගේ අනුමැතිය ද ලබාගත යුතු ය.

2.15 පළාත් තරග ප්‍රතිඵල ඉතා පැහැදිලිව හා නිවැරදිව සකස් කර, තරග ශීර්ෂ අනුව ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන පමණක් පාසලේ ලිපිනය ද නිවැරදිව සඳහන් කර අවසන් තරගය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එවිය යුතු ය.

2.16 සම ස්ථාන ප්‍රතිඵල ලබා දීමෙන් වැළකී සිටිය යුතු ය.

2.17 පළාත් මට්ටමේ ප්‍රථම ස්ථාන ජයග්‍රාහකයින් පමණක් ජාතික මට්ටමේ තරගයකට ඉදිරිපත් කළ යුතු ය. මෙහි සම්පූර්ණ වගකීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සතුවේ. කුමන හේතුවක් මත හෝ එක් තරග ශීර්ෂයක් යටතේ එක් පළාතකින් පාසල් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සහභාගි කළ නොහැක. ජාතික තරගයට පළාත් මට්ටමෙන් ප්‍රථම ස්ථානය දිනාගත් පාසලට පමණක්ඉදිරිපත් වීමට අවස්ථාව ලැබේ.

## 03. තරග විනිශ්චය

කලාප තරග විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලය අදාල කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ද, පළාත් තරග විනිශ්චය කටයුතු සඳහා වන විනිශ්චය මණ්ඩලය අදාල පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ද, තම කලාප / පළාත් සෞන්දර්ය හෝ සංගීත විෂය භාර නිලධාරීන්ගේ නිර්දේශ මත පත් කළ යුතුය. අවසන් තරගයේ විනිශ්චය සංයුතිය තීරණය කරනු ලබනුයේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ සංගීත විෂය භාර අධ්‍යක්ෂගේ උපදේශකත්වයෙන් හා සෞන්දර්ය අධ්‍යක්ෂක ගේ අනුමැතිය මතය. එමෙන්ම යම් තරග ශීර්ෂයක විෂයානුබද්ධ ගැටළුවක් මතු වී ඇති විටෙක, ඒ පිළිබඳව යම් තීරණයක් ගත යුතු යැයි හැගේ නම් පමණක්, අධ්‍යාපන ලේකම්ගේ එකඟතාව මත විනිශ්චය මණ්ඩලය සමග සාකච්ඡා කර තීරණයක් ගැනීම සිදුවේ.

- ඉහත තරග දෙකට අදාලව, කලාප තරගයට සිසු / සිසුවියන් සහභාගි කරවීම ඒ ඒ කලාපවල සෞන්දර්යය විෂය අධ්‍යක්ෂවරයාගේ සහ විදුහල්පති වරයාගේ වගකීම වේ. තරගය සඳහා ඉල්ලුම් කරන්නන් මෙම චක්‍රලේඛය සමග අමුණා ඇති ඉල්ලුම්පත්‍රය අනුව ඉල්ලුම් කළ යුතු ය. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී යතුරු ලියනය කිරීම කළ නොහැකි නම් පැහැදිලි කැපිටල් ඉංග්‍රීසි අක්ෂර වලින් සම්පූර්ණ කළ යුතු ය. එලෙසම අනෙකුත් පාසල්වල ගුරුවරුන්, සිසුන් සහාය වාදනයට සහභාගි වන්නේ නම් ඉහත සඳහන් ආකෘතිය භාවිත කළ යුතු ය.

මෙම තරගය සඳහා ඉදිරිපත්වන සියලුම තරග කරුවන් හා අනෙකුත් පාර්ශවකරුවන් තරගයේ සෑම අවස්ථාවක දීම මෙම තරග චක්‍රලේඛයේ සඳහන් සියලුම නීති රීති පිළිපැදීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් එකඟ විය යුතු ය. සමස්ත ලංකා මට්ටමෙහි අවසාන තරගයට ඉදිරිපත්වන පාසල් සඳහා ලබා දෙන තරග කාලසටහන් ගොනුවෙහි අමුණා ඇති ප්‍රකාශනය හොඳින් කියවා තේරුම් ගෙන විදුහල්පති විසින් නියමිත ස්ථානයෙහි අත්සන් යොදා තරගයට ඉදිරිපත් විය යුතු ය. මෙම චක්‍රලේඛයෙහි දක්වා ඇති වගන්ති හා සීමාවන් එකකට හෝ කිහිපයකට හෝ පටහැනිව කටයුතු කර ඇති බව අනාවරණය වුවහොත් තරගයේ කුමන අවස්ථාවකදී වුවද ප්‍රතිඵල ලේඛන වලින් එම විදුහල ඉවත් කිරීම, විනයානුකූල පියවර ගැනීම ඇතුළු අදාළ වෙනත් තීරණ ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය සතුවේ.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

## இணைப்பு 01

### மாதிரி விண்ணப்பப் படிவம்

(இம் மாதிரிக்கேற்ப விண்ணப்பப்படிவத்தைத் தயாரித்தல் வேண்டும். விண்ணப்பப்படிவம் தயாரிக்கும்பொழுது தட்டச்சு அல்லது கணினியைப் பயன்படுத்துவது சிறப்பானது)

# அகில இலங்கை பாடசாலை பரத நாட்டியப் போட்டி மற்றும் கதக் நடனப் போட்டி 2022

(உரிய கூட்டினுள் √ அடையாளம் இடுக)

பாடசாலை மாணவர் தொகை

| 300 இற்குக் குறைந்த | 301 – 1000 இற்கும் இடைப்பட்ட | 1001 இற்கு மேற்பட்ட |
|---|---|---|
| | | |

01. பாடசாலையின் பெயரும் முகவரியும் :-

02. தொலைபேசி இலக்கம் (பாடசாலை ................. அதிபர் .............. ஆசிரியர் ..............)

03. பாடசாலை அமைந்துள்ள மாகாணம் :

04. பாடசாலை அமைந்துள்ள கல்வி வலயம் :

05. தோற்றுகின்ற போட்டியின் பெயர் : (சுற்றுநிருபத்துக்கேற்ப குறிப்பிடுக)

| | போட்டித் தலைப்புகள் | நிகழ்ச்சி இலக்கம் | தனி / குழு |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |

06. போட்டியில் பங்குபற்றும் மாணவ மாணவியரின் பெயர்ப்பட்டியல் ( ENGLISH CAPITAL) ஆங்கில கெப்பிட்டல் எழுத்துக்களில் எழுதுக)

| | மாணவ / மாணவியின் பெயர் | பெண் / ஆண் | கல்வி கற்கும் தரம் | பிறந்த திகதி | கையொப்பம் |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |

(குழுப் போட்டிகளின் போது தேவையான விதத்தில் தயாரித்துக்கொள்ளல் வேண்டும்)